# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2077/55 – 2018 ජුනි මස 30 වැනි සෙනසුරාදා – 2018.06.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස – පළාත් සභා

## පළාත් සභා නිවේදන

### උතුරු පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනත සමඟ කියැවෙන 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත.

බලතල පැවරීම

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනත සමඟ කියැවෙන 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ 2(2) වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇත්තා වූ බලතල ප්‍රකාරව, උතුරු පළාතේ කාන්තා කටයුතු, පුනරුත්ථාපන, සමාජ සේවා, සමුපකාර, ආහාර සැපයුම් හා බෙදා හැරීම්, කර්මාන්ත හා ව්‍යවසාය ප්‍රවර්ධන සහ වෙළඳ හා වාණිජ්‍ය අමාත්‍යවරිය අනන්ති සසිතරන් මහත්මිය වන මම, උතුරු පළාතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් සහායවීමට පත්කර ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ I වැනි තීරුවෙහි සඳහන් එක් එක් තැනැත්තෙකුටම, 1983 අංක 32 දරන සමුපකාර සමිති (සංශෝධන) හා 1992 අංක 11 දරන සමුපකාර සමිති (සංශෝධන) පනත්වලින් සංශෝධනය වූ, 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත හා ඒ යටතේ පනවා ඇති රීතිමාලාව යටතේ සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත පැවරී ඇත්තා වූ බලතල, එම උපලේඛනයේ III වැනි තීරුවෙහි සඳහන් බලතල වත්මන්හි තම බල ප්‍රදේශය තුළ එම උපලේඛනයේ II වැනි තීරුවෙහි සඳහන් දිනයේ සිට ක්‍රියාත්මක කිරීමට මෙම නියෝගය මඟින් පවරමි.

අනන්ති සසිතරන්,  
අමාත්‍යවරිය,  
කාන්තා කටයුතු, පුනරුත්ථාපන, සමාජ සේවා, සමුපකාර,  
ආහාර සැපයුම් හා බෙදා හැරීම්, කර්මාන්ත හා ව්‍යවසාය ප්‍රවර්ධන  
සහ වෙළෙඳ හා වාණිජ කටයුතු අමාත්‍ය,  
උතුරු පළාත.

2018 ජුනි මස 13 වැනි දින,  
යාපනයේ දී ය.

1A – PG 4095 – 08 (2018/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| I තීරය | II තීරය | III තීරය |
|---|---|---|
| 1. අන්තෝනි සෙබමාලයි මහතා | 2015.03.25 | සමුපකාර සමිති පනතේ 3, 4(4(2) හැර) 5, 6, 7, 8, 33, 39, 42, 43, 44, (44(6) හැර) 45, 46, 50, 52, 53, 54, 58(58(2) (අ) සහ 58(5) හැර) 59, 68, 72 යන වගන්තින් යටතේ වන රෙජිස්ට්‍රාර්ගේ සියළුම බලතල සහ සමුපකාර රීති මාලාවලින් 4, 11, 15, 16, (ii), 18, 19, 20, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49, (49(xii) හැර) 52, 53 යන රීතිමාලා යටතේ වන රෙජිස්ට්‍රාර්ගේ සියළුම බලතල |
| 2. පොන්නයියා මෝහන් මහතා | 2016.01.29 | |
| 3. කනකම්මා නල්ලතම්බි මහත්මිය | 2016.02.02 | |
| 4. ඉන්දිරා සුබසිංහ මහත්මිය | 2016.06.09 | |
| 5. අප්පයියා සිංගනායගම් මහතා | 2017.11.02 | |
| 6. ෆරීන් හස්සානා අබ්දුල් සම්යූ මෙනවිය | 2018.03.29 | |

07 – 464

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.